# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.12.06 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/2172/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මොරගහහේන පොලිස් වසම.

2025.12.05 වන දින උදෑසන කාලයේ මොරගහහේන පොලිස් වසමේ ගෝනපල ප්‍රදේශයේදී ඉඩමේ මායිමක ආරවුලක් හේතුවෙන් බහින් බස් වීමක් දුරදිග ගොස් පුද්ගලයෙකු පහරදීම හේතුවෙන් තවත් පුද්ගලයෙකු රෝහල් ගත කිරීමට රැගෙන යාමේදී මියගොස් ඇති බවට මොරගහහේන පොලිස් ස්ථානයට ලද 119 පණිවිඩයට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ කෝපිවත්ත, ගෝනපල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අපරාධයට සම්බන්ධ වයස අවුරුදු 71 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය හා හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

2025.12.05 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කසල අංගනය අසල මාර්ගයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක් ත්‍රීරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. අයිස් මත්ද්‍රව්‍ය හා කොකේන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බොරැල්ල පොලිස් ස්ථානය.

2025.12.05 වන දින සවස් කාලයේ බොරැල්ල පොලිස් වසමේ දුම්රිය ක්‍රීඩාංගනය අසලදී බොරැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 226 මිලි ග්‍රෑම් 860 ක් හා කොකේන් ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 930 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 04. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - මාතර පොලිස් වසම.

2025.12.05 වන දින උදෑසන කාලයේ මාතර පොලිස් වසමේ පිලදූව දුම්රිය ස්ථානය ආසන්නයේදී කොළඹ සිට බෙලිඅත්ත දක්වා ධාවනය වූ දුම්රියක ගැටී පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට මාතර පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කරන ලදී.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ අඹගහවත්ත, ගෝනපීනුවල ප්‍රදේශයේ පදිංචි යුධ හමුදා සෙබළෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. දියේ ගිලී මියයාමක් - හික්කඩුව පොලිස් වසම.

2025.12.05 වන දින උදෑසන කාලයේ හික්කඩුව පොලිස් වසමේ හික්කඩුව මුහුදු තීරයේ දිය නාමින් සිටි විදෙස් ජාතික කාන්තාවක් දියවැලකට හසු වී දියඹට ගසාගෙන ගොස් ඇති අතර හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නාවික හමුදාවේ සහාය ඇතිව කාන්තාව බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබාදී කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හික්කඩුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 59 ක් වූ රුසියානු ජාතික කාන්තාවකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. ගණිකා නිවාසයක් වටලා විදෙස් ජාතික සැකකාරියන් සිව්දෙනෙකු අත්අඩංගුවට - වැල්ලවත්ත පොලිස් ස්ථානය.

2025.12.05 වන දින සවස් කාලයේ වැල්ලවත්ත පොලිස් වසමේ දුම්රියපොල පාර ප්‍රදේශයේදී වැල්ලවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසක් වටලා විදෙස් ජාතික සැකකාරියන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරියන් අවුරුදු 34, 36 හා 38 වයස්වල පසුවන තායිලන්ත ජාතිකයින් වේ.**

වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මහියංගණය පොලිස් වසම.

2025.12.05 වන දින සවස් කාලයේ මහියංගණය පොලිස් වසමේ මහියංගණය පදියතලාව මාර්ගයේ උල්හිටිය පාසල අසලදී වර්ෂාව සහිත අවස්ථාවක මහියංගණය දෙස සිට පදියතලාව දෙසට ධාවන වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා දඹාන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ ධර්මරත්න මාවත, අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මහියංගණය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2025.12.05 වන දින රාත්‍රී කාලයේ වාරියපොල පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ වැරැල්ල හන්දියේදී අනුරාධපුර දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ කාර් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාර් රථයේ රියදුරු, එහි ගමන්ගත් පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු හා කාන්තාවක් වාරියපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එහි ගමන්ගත් පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු මියගොස් ඇත. රියදුරු හා කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කර ඇත. මියගිය දෙදෙනා හා තුවාල ලැබූ කාන්තාව එකම පවුලේ මව, පියා සහ පුත්‍රයා වේ.

**මරණකරුවන් අවුරුදු 15 හා 61 වයස්වල පසු වූ පොල්වත්ත, දැරණියගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරය වාරියපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.**

2025.12.05 වන දින සවස් කාලයේ කැබිතිගොල්ලෑව පොලිස් වසමේ කැබිතිගොල්ලෑව හොරොව්පතාන මාර්ගයේ හිජ්ජාපුර හන්දියේදී හොරොව්පතාන දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ සිටි ගවයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කැබිතිගොල්ලෑව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු ක් 45 වූ රස්නකවැව, වලහවිද්දවැව ප්‍රදේශයේ පදිංචි කැබිතිගොල්ලෑව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කල පොලිස් සැරයන්වරයෙකි.**

මෘත ශරීරය කැබිතිගොල්ලෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කැබිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - අඟුණුකොළපැලැස්ස අධිවේගී මාර්ග අනුපාලක ස්ථානය.**

2025.12.05 වන දින සවස් කාලයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කසාගල පිවිසුම ආසන්නයේදී මත්තල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ කාර් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ධාවනය වූ මාර්ග සංවර්ධන අධිකාරියේ නඩත්තු කටයුතු සඳහා යොදවා තිබූ බවුසර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු, ඔහුගේ බිරිඳ, දරුවන් දෙදෙනා හා බිරිඳගේ මව බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා තංගල්ල රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු හා බිරිඳගේ මව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 73 ක් වූ ගලගම දකුණ, නාකුළුගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**